# ප්‍රසම්පාදන දැන්වීම

**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල**

## හෝජනාගාර සේවාව සැපයීම

පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ඉහත සඳහන් සේවාව 2026/2027 වර්ෂය සඳහා පවත්වාගෙන යාමට සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන්, ආයතන වෙතින් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවනු ලැබේ. මෙම ආයතනයේ පැවැත්වෙන සියලුම පුහුණු වැඩමුළු, සම්මන්ත්‍රණ, උත්සව සඳහා සහභාගී වන අමුත්තන්ට දේශීය විදේශීය ආහාර වට්ටෝරු අනුව දිවා රාත්‍රී ආහාරපාන සකස් කොට පිළිගැන්වීම කළ යුතු අතර තෝරා ගන්නා සැපයුම්කරු අවම වශයෙන් මාසිකව රු. ලක්ෂ 20ක වත් පිසූ ආහාර සැපයිය හැකි ආයතනයක් හෝ පුද්ගලයෙකු විය යුතුය.

## පොදු කොන්දේසි

අයදුම් කරනු ලබන පුද්ගලයින් හෝ ආයතන, සමුපකාර සංවර්ධන රෙජිස්ට්‍රාර්වරයා යටතේ හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ, හෝ සමාගම් පනත යටතේ හෝ ලියාපදිංචි කල සමුපකාර සමිති, හවුල් ව්‍යාපාර හෝ තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ සමාගම් විය යුතු අතර අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 කට නොඅඩු මනා පලපුරුද්දක් තිබිය යුතු අතර මෙම පළපුරුද්ද ව්‍යාපාර ලියාපදිංචියෙන් පසුව හා මිල ගණන් කැඳවන වර්ෂයට ආසන්න පූර්ව වර්ෂ 03 ක් විය යුතුය.අදාල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කල යුතුය.

## ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ලබා ගැනීම

අදාල සුදුසුකම් හා කොන්දේසි ඇතුලත් ලේඛන සහිත ඉල්ලුම්පත් 2026.03.16 වන දින සිට 2026.03.30 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා පොල්ගොල්ල පිහිටි ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. ඒ සඳහා ආපසු නොගෙවන රු3,500.00ක ටෙන්ඩර්පත් ගාස්තුවක් ගෙවිය යුතු වේ.නියමිත ඉල්ලුම්පත්‍ර ආකෘති මගින් පමණක් අයදුම් කල යුතුය. ඡායා පිටපත් ප්‍රතික්ෂේප කෙරේ.

## ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ඉදිරිපත් කිරිම හා ඇප මුදල්

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුව සමඟ ඉදිරිපත් කල යුතුය.ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුව**"අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය "**නමට මහ බැංකුව පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු.150,000.00ක බැංකු ඇපකරයක් මගින් හෝ ආයතනයේ ගිණුම් අංශයට රු.150,000.00ක මුදල් තැන්පත් කිරීම මගින් කල හැක.ටෙන්ඩර්පත්‍රය සමග අදාල බැංකු ඇපකරයේ මුල් පිටපත හෝ ගිණුම් අංශයේ මුදල් තැන්පත් කරන ලද ලදුපතේ මුල් පිටපතක් ඇමිණිය යුතුය. මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත් වම්පස උඩ කෙළවරේ**"ප්‍රසම්පාදන මිල ගණන් ඉදිරිපත් කිරීම - හෝජනාගාර සේවය 2026/2027"** යනුවෙන් සඳහන් කර 2026.03.31 වන දින ප.ව 2.30 ට හෝ ඊට පෙර පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ආයතනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කල හැක.

## ප්‍රසම්පාදන ඉල්ලුම්පත් විවෘත කිරීම

2026.03.31 වන දින ප.ව. 2.45 ට පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේදී ප්‍රසම්පාදන ඉල්ලුම්පත් විවෘත කරන අතර, එම අවස්ථාවේදී ඉල්ලුම්කරුට හෝ නම් කල නියෝජිතයෙකුට ඒ සඳහා සහභාගි විය හැකිය. ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,**
**පොල්ගොල්ල.**
**දුරකථන : 0812-498680**